# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2342/32 - 2023 ජූලි මස 27 වැනි බ්‍රහස්පතින්දා - 2023.07.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාතේ පළාත් සභාව

බස්නාහිර පළාත් සභාවේ 1998 අංක 03 දරන සමුපකාර සමිති ප්‍රඥප්තිය යටතේ බලතල පැවරීමේ නියෝගය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(ඇ) ව්‍යවස්ථාව සමග කියවිය යුතු බස්නාහිර පළාත් සභාවේ 1998 අංක 03 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියේ 02(2) වගන්තිය යටතේ බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවර රොෂාන් ගුණතිලක වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව බස්නාහිර පළාතේ සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයාට සහය වීම පිණිස පත් කර ඇත්තා වූ පහත උපලේඛනයේ ඇතුලත් එහි I වැනි තීරුවේ නම සඳහන් අනුරූපීව II තීරුවේ සඳහන් තනතුර දරන්නා වෙත එහි උපලේඛනයෙහි III තීරුව යටතේ නිශ්චිතව විස්තර වන බලතල 2023.06.19 දින සිට ක්‍රියාත්මක වන පරිදි පවරනු ලබන බව මෙයින් නිවේදනය කරමි.

**රොෂාන් ගුණතිලක,**
ආර්ඩබ්පී ඇන්ඩ් බාර් වීඑස්වී යූඑස්පී පීඑච්ඩී (ගෞරව)
එෆ්අයිඑම් (ශ්‍රී ලංකා) එන්ඩීසී පීඑස්සී
මාර්ෂල් ඔෆ් ද ශ්‍රී ලංකා එයාර් ෆෝස්
ආණ්ඩුකාරවර,
බස්නාහිර පළාත.

2023 ජූලි මස 13 වැනි දින,
බත්තරමුල්ල,
බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ලේ පිහිටි,
බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

1A - PG 6416 — 07 (2023/07)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**I වැනි උපලේඛනය**

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| 1) වීරසිංහ මුදියන්සේලාගේ භාග්‍යා ලක්මාලි වීරසිංහ | සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (ශ්‍රී.ලං.ප.සේ II) | බස්නාහිර පළාත් සභාවේ 2011 අංක 04 දරන සමුපකාර ප්‍රඥප්තියෙන් සංශෝධිත 1998 අංක 03 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියේ අංක. 02(3), 4, (4(2) හැර), 5, 6, 7, 8, 33, 43(අ), 43(ආ), 44, 45, 46, 47, 50, 52, 53, 54, (54(2) හැර), 58(2), 59, 67, 68, 69, 74, හා 76 යන වගන්ති යටතේ රෙජිස්ට්‍රාර්වරයා සතු බලතල සහ 1972 අංක 05 දරන සමුපකාර රීති මාලාවේ 4, 11, 15, 16(II), 19, 22(II), 27, 32, 37, 39, 40, 41, 42, 49, 52 හා 53 යන වගන්ති යටතේ රෙජිස්ට්‍රාර්වරයා සතු බලතල. |

EOG 07 - 0258

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.